සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# අවසාන වාර පරීක්ෂණය 2016

**11 ශ්‍රේණිය** **සිංහල සාහිත්‍ය රසාස්වාදය** **කාලය පැය 03 යි.**

| නම/ විභාග අංකයඃ |
| --- |

- **I** කොටසෙහි 01, 02 ප්‍රශ්නවලටත්, **II** කොටසෙහි 03 වැනි ප්‍රශ්නයටත්, **III** කොටසෙහි 04, 05, 06, 07 ප්‍රශ්නවලින් තෝරාගත් ප්‍රශ්න දෙකකටත් පිළිතුරු සපයන්න.

## I කොටස

(01) (i) සිට (v) දක්වා ප්‍රශ්නවලට කෙටි පිළිතුරු ලියන්න.

(i) ''මේ කිමෙක් ද මහලු බමුණෙකු ගෙනගිය නියාව මම දිටිමි කුමක් කියා මට වළහා කියව් දෑ''

(අ) මේ ප්‍රකාශය කළේ කවරෙක් ද?

(ආ) මෙහි මහලු බමුණෙකු යනු කවුරුන් ද?

(ii) ''අපගේ කුලයෙහි උපන්නවුන්ගෙන් පරමායු ගෙවා මියන්නවුන් මුත් අතුරෙක මියන කෙනෙක් නැත.''

(අ) අතුරෙක මියන කෙනෙක් නැත. යනුවෙන් පැවසුවේ කවුරුන් ද?

(ආ) මෙම පාඨය ඇතුළත් කෘතිය නම් කරන්න.

(iii) ''පියරූ දූම්මට මුහුණේ ගඳ යනවාදෑ?''

(අ) මෙම ප්‍රකාශය කළේ කවරෙක් ද?

(ආ) ප්‍රකාශය ශ්‍රවණය කළ තැනැත්තා කවුද?

(iv) '' නපුරු කලට සත හට පැමිණෙන **වෙහෙස**
එදුරු නොවෙයි කළ පව් පල දෙවා **මිස**
**තඹුරු** වනය මුකුලිත වන බව **හවස**
කවුරු විසින් වැළකිය හැකි මෙ දිය **කුස**''

(අ) මෙහි මුල් කවි පද දෙකේ අදහස ලියන්න.

(ආ) තද කළු අකුරෙන් මුද්‍රිත පදවල අර්ථ වෙන වෙනම ලියන්න.

(v) සිය දහස්
කෝ වේ හමුව නා
මං සන්ධි පසුවන
අත වනා
දහසක් දෙනා
එක පියවරින්
දහසක් යොදුන් දුර
අරඹනා

(අ) සිය දහස් කෝ වේ හමුවනා යන්නෙහි තේරුම කුමක් ද?

(ආ) මෙම කවිය ඇතුළත් පැදි පෙළේ රචකයා කවරෙක් ද? (ලකුණු $4 \times 5 = 20$)

(02) පහත දී ඇති පැදි පෙළ කියවා අසා ඇති ප්‍රශ්න උපයෝගී කොට ගෙන රසාස්වාදයක් ලියන්න.

(1) වැහි වලාකුළ, පෑ කළු යැයි ඔබේ
නො හොබිතියි කිසි ලෙස් නොසතොස් නොවන්
සිරුරු පැයෙනුගත් සුදනෝ ලොවේ
නො හඳුනත් උතුමන් ගුණයෙන් විනා

(2) පැනැ නැඟී අහසේ පැතිරී ගොසින්
මහ ගිමන් සිඳුවා සත සිත් තොසින්
කුඹුරු වැව් පොකුණුත් පුරවා දියෙන්
ලොවට දෙන්නා ඔබයි අහරත් පැනුත්

(3) නද අසා ඔබ ගේ පැහැයත් බලා
මොනරු පිල් විදහා රඟ දෙත් නදින්
අමුතුයෙන් පණවත් බව ලත් සෙයින්
තුරු ලියත් ලියලයි සැනසී දියෙන්

(4) සුදු වලා කුළු බෝමැ අහස් කුසේ
ඉහළ යෙයි; ඔබ සැම පහත් වැමැයි
ඒ පුදුමෙක් ද? උසස් නැණවත් දනෝ
ගුණ බරින් නැමුණෙ වී පවතිත් නිතින්

(5) කටට ගැන්ම ද බෝ මැ අමාරු වූ
කර දියත් ඔබ ගත් කලැ සාගරෙන්
මිහිරි වෙයි උතුමන් සහ වාසයෙන්
නිවටයෝ ද උසස් වෙති බෝ සෙයින්

(6) ගුණ බලා ඔබ ගේ ලෝ සබා දහම්
ඔබැ රැ අන් කිසිවෙක් නිසි නැ කියා
විදුලියත් පැහැපත් රන දම් සෙයින්
පළඳවන්නේ ඔබේ ගෙලෙ මැයි බලන්

(ලකුණු 25 යි.)

(i) මෙම පද්‍ය පංතිය වත්මන් සමාජයට ගැළපිය හැකි ආකාරය විමසන්න. (ලකුණු 05)

(ii) මෙම පද්‍ය පංතිය ඉදිරිපත් කිරීම සඳහා යොදා ගෙන ඇති උපායන් පිළිබඳව විමසන්න. (ලකුණු 05)

(iii) මෙම පද්‍යයෙහි ඔබ දකින සුවිශේෂතා මොනවා ද? (ලකුණු 05)

(iv) ''කළු පැහැය පිළිබඳව සමාජයේ පවතින ආකල්පය නිශේධනය කිරීමට වැහි වලාකුළ නිර්මාණය සමත්වන ආකාරය කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05)

(v) මෙහි කවියා යොදාගෙන ඇති පරිසර වස්තූන් කවරේදැයි දක්වන්න. (ලකුණු 05)

## II කොටස

(03) පහත දැක්වෙන ගද්‍ය පද්‍ය කොටස් දෙකින් එක කොටසකට පමණක් උත්තර සපයන්න.

''අම්මා සපත්තු ඇතුළට රෙදි පාංකඩ දමා හිර කර මගේ කකුල ඔබා බැලීය. ඒත් සපත්තු බුරුල්ය. ඇවිදින විට ලොක ලොක ගා හෙලවෙයි. විලුඹෙන් පනී''

''පුංචි අම්මාගේ මංගල්ලෙට පැමිණි ගැමියන් මඟුල් මේසයේ අසුන්ගෙන අහර ගන්නා විලාසය ද, ගැමියාට නිතර රස මසවුළු සමග අහර නොලැබේ. ලද විටෙක ඔවුහු ගිජු ලෙස අහර ගනී. මස්, මාළු, අච්චාරු මේවා දෙස ඔවුන් බලන්නේ ගොදුරක් දුටු වන මෘගයන් මෙනි. ඔවුහු නැහැයෙන් සෙම පෙරමින් හායි හූයි ගා මසුත් බතුත් කති.'' කැම කා අත සෝදා මේස රෙද්දෙන්ම අත පිසදා ගනිති.

කරත්තයෙන් බැස බඹ දහයක් යන්නට පෙර කකුල් කැපුණි. අඩිය තියන තියන පාරට කකුල රිදෙයි. මම අවටඅයට ඒ බවක් නාගවා ගමන බාල කර කොර ගසමින් සෙමින් යමි.

(1) මෙම උද්ධෘත ඇසුරෙන් සිරිසේනගේ චරිතය පිළිබඳ කෙබඳු ලක්ෂණ ඉස්මතු වේ ද? (ලකුණු 05)

(2) තුංමං හන්දිය කතාකරු අපූර්වත්ත්වයෙන් යුතුව භාෂාව හසුරුවා ඇති බවට නිදසුන් දෙකක් ඉදිරිපත් කරන්න. (ලකුණු 05)

(3) ''මෙම නවකතාවේ සාර්ථකත්වයට එහි මනා සිද්ධි ගැළපීම ඉවහල් වී ඇත.'' මෙම පාඨය ඇසුරෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05)

(4) නවකතාවේ භාවිත දෘෂ්ටි කෝණය එහි සාර්ථකත්වයට ඉවහල් වී ඇති අයුරු උද්ධෘත කොටස ඇසුරෙන් විමසන්න. (ලකුණු 10)

## නැතහොත්

හිස නමා ගති ඈ
සිහින් රතැඟිලි පටලවා ගති
සතියකට පෙර ගෙනා වර
විළිබරය මගෙ රන්වන් මනාලිය

දූල් තිර අස්සෙන්
පෙනෙයි ඈ
ඔබ යනු මොබ එනු
පට පිළී ගෙන අබරණ පෙට්ටි ගෙන

ඇසෙයි නොපෙනෙන විටත්
සාලයෙන් කාමරයට
කාමරයෙන් සාලයට
යන පා හඬ
මා වෙත එතත් ඈ
වුවමනාවක් කිසිත් නැතිවද
නො රැඳෙයි, පලා යෙයි
ගෑ විලවුනෙහි,
නැත, රන්වන් සමෙහි
හෙළන සුස් මෙහි සුවඳය ඒ
ඈ බඳ සුවඳ
දූනෙන්නෙ මට විතර ද?

පෙනෙයි ඈ
ඇසෙයි
දූනෙයි
මට ගේ හැම තැන

(i) මෙම කවිපන්තියේ චිත්තරූප මැවෙන අවස්ථා දෙකක් දක්වන්න. (ලකුණු 05)

(ii) මෙම කවියේ වස්තු විෂය කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05)

(iii) වඩා දැඩි සංයමයකින් දෙහදක එක්වීම ඉතා සංවේදීව ඉදිරිපත් කරයි. විමසන්න. (ලකුණු 05)

(iv) කවියා ධ්වනිතාර්ථවත් බසක් භාවිත කර ඇති අයුරු පිළිබඳ විමසීමක් කරන්න. (ලකුණු 10)

## III කොටස

- **මෙම කොටසින් ප්‍රශ්න දෙකකට පමණක් පිළිතුරු සපයන්න. (එක් පිළිතුරක් වචන 150 ක් වත් තිබිය යුතුය.)**

(04) සුභාෂිතය එදිනෙදා මිනිසුන්ට ජීවත්වීමට අවශ්‍ය උපදේශ ලබාගත හැකි අත් පොතකි. නියමිත පද්‍ය තුනක්වත් ඇසුරෙන් පහදන්න. (ලකුණු 15)

(05) කුස ජාතක කතාවේ ප්‍රබල සංකල්ප රූප මැවෙන අවස්ථා තුනක් විමසුමට බඳුන් කරන්න. (ලකුණු 15)

(06) ''ජීවන වෘත්තීන් හා බැඳුණු අත්දැකීම් ජන කවියට වස්තු විෂය වී තිබේ.'' නිදසුන් සහිතව විමසන්න. (ලකුණු 15)

(07) තුංමං හන්දිය නවකතාවේ එන සිරිසේනගේ චරිතය පිළිබඳ විමසීමක් කරන්න. (ලකුණු 15)

**පිළිතුරු පත්‍රය - I කොටස**

01. (i) (අ) ඔක්කාක රජු (ආ) සක්දෙව් රජු

(ii) (අ) දම්පල් කුමරු (ධර්මපාල කුමාරයා) (ආ) සද්ධර්මරත්නාවලිය

(iii) (අ) පොඩි අයියා (ආ) නංගිට

(iv) (අ) නරක කාලයට සත්ත්වයාට දුක් කරදර පැමිණෙන විට, කරන ලද පව්වලට විපාක ලබා දී මිස ඒ දුරු නොවේ.

(ආ) තඹුරු වනය නෙළුම් විල
මේ දිය කුස මේ ලෝකය තුළ

(v) (අ) අපයන මඟ සිය දහස් කුඩා වීථි හමුවේ. (ආ) රත්න ශ්‍රී විජේසිංහ

ප්‍රශ්න අංක (02) සිට (07) දක්වා නිවැරදි පිළිතුරුවලට ලකුණු ලබාදෙන්න.

e-තක්සලාව
The National e-learning Portal for The General Education